# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය

# ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான

# இலங்கை முகவராண

# Sri Lanka Anti-Doping Agency

## 2014 වාර්ෂික කාර්යසාධන වාර්තාව

## வருடாங்கு முனவினேறவிற அறிகவிகை

## 2014 Annual Performance Report

# සභාපති තුමන්ගේ පණිවුඩය



**මහාචාර්ය අර්ජුන ද සිල්වා**
සභාපති

2013 වර්ෂයේ අග භාගයේ දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්ථාපනය කිරීම මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයේ දිගුකාලින අවශ්‍යතාවක් සපුරාලීමක් බව මහත් අභිමානයෙන් පැවසිය හැකිය.

ඇතැම් අවස්ථා වලදී ජාත්‍යන්තර මට්ටමින් අප රට නියෝජනය කළ සමහර ක්‍රීඩකයන් තහනම් උත්තේජක භාවිතා කළ බවට චෝදනාවන්ට ලක් වීම නිසා එමගින් ශ්‍රී ලංකාවට අත් වූ අපකීර්තිය සුළුපටු නොවේ. ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය භාවිතා කිරීම සහමුලින්ම තුරන් කිරීම මෙම ආයතනය ස්ථාපිත කිරීමේ මූලිකම අරමුණ වී ඇත.

එමෙන්ම, ආසියානු කළාපයේ තහනම් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව ඉතා ශක්තිමත් නීති පදනමක් සහිත පනතක් ලෙස 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත හැඳින්විය හැකිය. මෙම පනතේ වැදගත්ම ලක්ෂණය වන්නේ ක්‍රීඩකයෙකු හට තහනම් ද්‍රව්‍ය ලබා දෙන, ලබා ගැනීමට ක්‍රීඩකයා පොළඹවන, අනුබල දෙන, එම ද්‍රව්‍ය තමා සන්තකයේ තබා ගන්නා පුද්ගලයෙක් වුවද නීතියේ රැහැනට හසු කර ගැනීමට අවශ්‍ය විධි විධාන එමගින් සකසා තිබීමයි.

තහනම් ද්‍රව්‍ය භාවිතා කිරීම ක්‍රීඩාවේ ඒකායන අරමුණ වන සුපිරිසිදු බව හා සාධාරණත්වයට මහත් හානියක් වේ. මෙමගින් ප්‍රේක්ෂකයන් ද විශාල රැවටීමකට ලක්වෙන අතර ක්‍රීඩකයෙකුට වුවද දීර්ඝකාලින සෞඛ්‍ය ගැටලු රාශියකට මුහුණ පෑමට සිදුවේ. ඇතැම් විට මෙය ක්‍රීඩකයකුගේ මරණය සිදුවීමට තරම් අතිභයානක විය හැකිය.

මේ හේතු නිසා මෙම ද්‍රව්‍ය මර්ධනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම අප ආයතනයේ මූලික වගකීම බවට පත්ව තිබේ. එසේම මේ පිළිබඳව ක්‍රීඩකයන්, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් හා ක්‍රීඩකයන්ගේ පවුල්වල සාමාජිකයන් දැනුවත් කිරීම සිදු කළ යුතුය. එතෙකින් නොනැවති, අතිවිශාල මුදලක් වැයකරමින් තහනම් ද්‍රව්‍ය පරීක්ෂාවද මේ වන විට මෙම ආයතනය විසින් නිසිපරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සිදු කරනු ලබයි.

ඕනෑම ජාතික හා ජාත්‍යන්තර තරගාවලියක් ආවරණය කරමින් තහනම් ද්‍රව්‍ය පරීක්ෂාවන් සිදු කිරීමට අවශ්‍ය සම්පත් දායකයන් පුහුණු කර ගැනීම 2015 වර්ෂයේ අප ආයතනයේ මූලික අරමුණු අතර වේ.

එමෙන්ම, වසරක් වැනි ඉතාම කෙටි කාල පරාසයක් තුළ මෙම ආයතනය ලබා ඇති දියුණුව පිළිබඳව අවංකව සතුටු වන අතර, ඉදිරි වර්ෂවලදී ද සියලු අරමුණු ඉටුකරගනිමින් සාර්ථක ගමනක් යෑමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හැකි වේවායි සුබ පතමි.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



**වෛද්‍ය සීවලි ජයවික්‍රම**
අධ්‍යක්ෂ ජෙනරාල්

වත්මන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රමුඛ තැන හිමිවනුයේ සහජ හැකියාවෙන් පිරිපුන් පිරිසිදු ක්‍රීඩාව සඳහාය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවීමේ මුඛ්‍ය අරමුණ වූයේ ද සියළුම ආකාරයේ තහනම් උත්තේජක භාවිතය මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් තුරන් කරලීමය. එබැවින් අප ආයතනය නිරතුරුව කැපවී ක්‍රියා කරන්නේ එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසාය.

මෙම අරමුණු කරා යන ගමනේ දී අපගේ ප්‍රමුඛ අවධානය අංශයන් දෙකක් වෙනුවෙන් යොමු කෙරෙනු ඇත. එනම්, තහනම් ද්‍රව්‍ය පිළිබද පරීක්ෂණ නිසි පිළිවෙත් අනුගමනය කරමින් සිදු කිරීමත්, දිවයින පුරා මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ය.

ඒ අනුව, 2014 වර්ෂයට අදාළව පරීක්ෂණ 233 ක් සිදු කිරීමට අපට හැකියාව ලැබුණු අතර, එම පරීක්ෂණයන්ට අනුව තහනම් උත්තේජකවලට අදාළ රීතීන් කඩ කළ ක්‍රීඩකයන්ට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීම ද 2014 වර්ෂයේදී සිදු කෙරිණි.

එසේම, දිවයිනේ සියළු පළාත් ආවරණය කරමින් දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීමට UNESCO ආයතනයෙන් අනුග්‍රහය ලැබුණු අතර, ඒ යටතේ ආසන්න වශයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් 2035 පමණ දැනුවත් කිරීමට අවස්ථාව ලැබුණි.

තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය පිළිබඳව සාමාන්‍ය ජනතාව තුළ දැනුවත්භාවය වැඩි කරලීමේ අරමුණින් ප්‍රචාරක වැඩසටහන් අප ආයතනයේ මැදිහත් වීමෙන් 2014 වර්ෂයේ දී දීපව්‍යාප්තව ආරම්භ කරනු ලැබීය.

2014 වසරේ දෙසැම්බර් වන විට අප ආයතනයේ වෙබ් අඩවිය නිර්මාණය කර ගැනීමට ඉඩ ලැබීම ද අප ලද තවත් ජයග්‍රහණයකි.

තහනම් උත්තේජක වලින් තොර ක්‍රීඩාවක් දැයට දායාද කිරීම උදෙසා පෙර වසරටත් වඩා වැඩි කැපවීමකින් ඉදිරි වර්ෂයේදී කටයුතු කිරීම අප ආයතනයේ මූලික අභිලාශය වේ.

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිස ද, උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මගින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි වීම සඳහා අදාල දේශීය නෛතික යාන්ත්‍රණයක් නිශ්චිතවම සඳහන් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත 2013 සැප්තැම්බර් 09 වන දින කෙටුම්පත් කරන ලදී.

2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ III වන කොටස මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවීම පිළිබඳ විධිවිධාන සලස්වා ඇත.

මෙම ආයතනයේ මූලික අරමුණු අතර පර්යේෂණ අංශය ප්‍රමුඛස්ථානයක් හිමි කර ගනියි. එහිදී බලාපොරොත්තු වන්නේ, උත්තේජක භාවිතාවේ හා උත්තේජන පරීක්ෂණවල නව ප්‍රවණතා හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ සිදුකරන උත්තේජක පරීක්ෂාවන් ජාත්‍යන්තර මට්ටමින් පවත්වා ගැනීම ආදිය වේ. එමෙන්ම, දේශීය වෛද්‍ය ක්‍රම ද ප්‍රමුඛස්ථානයක් ගන්නා ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටක එම ඖෂධවල අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකි ද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා පර්යේෂණවල නියැලීම ද මෙහි මූලික පරමාර්ථ අතර වේ.

තහනම් ද්‍රව්‍ය භාවිතාව හා එහි අතුරු විපාක ශ්‍රී ලංකාවට තවමත් නව මාතෘකාවකි. එම නිසා මහජනතාව හා ක්‍රීඩාවේ යෙදී සිටින පුද්ගලයින් අතර පවා උත්තේජක භාවිතාව පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැත. එසේ හෙයින් මේ සම්බන්ධයෙන් මහජන දැනුවත්භාවය ඇති කිරීමේ වගකීමක් ද අප ආයතනය සතු වේ. එම නිසා යුනෙස්කෝ ආයතනයේ මූලාධාර සහිතව දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන අතර මීට අමතරව එක් එක් ක්‍රීඩාවල යෙදෙන්නන් වෙනුවෙන් ද අවශ්‍ය අවස්ථාවල දී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. පාසල් මට්ටමින් ද වැඩසටහන් පැවැත්වීමට සැලසුම් සකස් කරමින් පවතී.

තහනම් ද්‍රව්‍ය භාවිත කිරීම කෙටිකාලීනව ජයග්‍රහණ ලබා ගැනීමට පහසු මගක් වුවත්, ඉන් දීර්ඝ කාලීනව මිනිස් ශරීරයට ඇති කළ හැකි බලපෑම සහ අතුරු විපාක සුළුපටු නොවේ. දීර්ඝ කාලීන උත්තේජක භාවිතාව තුළින් ක්‍රීඩකයන්ගේ මරණය පවා සිදුවිය හැකිය. එම නිසා මෙම උවදුරින් ක්‍රීඩාව හා ක්‍රීඩකයින් මුදවා ගැනීම සඳහා අමිල මෙහෙවරක් මෙම ආයතනය මගින් සිදු කරනු ලැබේ. මෙය සමාජ උවදුරක් වීමට ප්‍රථමයෙන් තහනම් ද්‍රව්‍ය භාවිතාව යන්න ක්‍රීඩාවෙන් මුලිනුපුටා දැමීම මෙම ආයතනයේ මූලික අරමුණයි.

රට නියෝජනය කරන යම්කිසි ක්‍රීඩකයෙක් තහනම් ද්‍රව්‍ය භාවිත කර ඇති බව සනාථ වුවහොත් ඉන් රටේ ගෞරවයට වන හානිය සුළුපටු නොවේ. එම නිසා මෙම වැරදි භාවිතාව මෙරටින් තුරන් කර ශ්‍රී ලාංකීය අභිමානය ජාත්‍යන්තරය ඉදිරියේ රැක ගැනීම අප ආයතනයේ මූලික වගකීමකි.

**දැක්ම**

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්.

**මෙහෙවර**

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසි වලට අනුකූල වන ආකාරයට 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම.

## අරමුණු

පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව:-
නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ :-

(අ) ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටු දැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම;
(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍රය හා අදාල පර්යේෂණ සහ නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

## නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය

නියෝජ්‍යායතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය පනතේ 12 වන වගන්තිය යටතේ දක්වා ඇත.

12. නියෝජ්‍යායතනයට, එහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා සහ එයට පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ බලතල තිබිය යුතු අතර විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සිදු කිරීමට බලතල තිබිය යුතුය:-

(අ) උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීමට, සම්බන්ධීකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට;

(ආ) උත්තේජක මර්දන උල්ලංඝනය කිරීම් වලට එරෙහිව පියවර ගැනීමට;

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපලක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට;

(ඈ) කිසියම් බැංකුවක ජංගම ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාමට;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩල වලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට;

(ඊ) නියෝජ්‍යායතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියළු ගිවිසුම් වලට ඇතුළත් වී ඒවා ඉටු කිරීමට;

(උ) නියෝජ්‍යායතනයට අයිති මුදල් කිසිවක් ආයෝජනය කිරීමට;

(ඌ) එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ලබා ගැනීමට;

(එ) මේ පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, ඔවුන් සේවයේ නියුක්ත කිරීමට, පාරිශ්‍රමික ලබා දීමට, ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ ඒ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට;

(ඒ) නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීමට; සහ

(ඔ) එහි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යයි නියෝජ්‍යායතනය අදහස් කරන වෙනත් යම් සියළු දේ සිදුකිරීමට.

පනතේ 13 වන වගන්තිය යටතේ, නියෝජ්‍යායතනයේ පරිපාලනය පාලක මණ්ඩලයක් වෙත පැවරිය යුතු බව දක්වා ඇත.

මණ්ඩලයේ සංයුතිය 14 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදි වේ.

14. (1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්, එනම්

(අ) නිල බලයෙන් පත් කල සාමාජිකයන්ගෙන් —

(i) ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධූරයක් දරන නිලධරයෙකුගෙන්,

(ii) ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(iii) ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(iv) ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයට පත්වූ (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.



(2) අමාත්‍යවරයා විසින්, පත්කළ සාමාජිකයන්ගෙන් එක් අයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුය. එසේ පත්කළ සභාපතිවරයා විසින් අවුරුදු තුනක කාල සීමාවක් සඳහා ධූරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතුය.

17 වන වගන්තියට අනුව පත්කල සාමාජිකයන්ගේ ධූර කාලය වසර 03 ක් පමණ වේ.




සැබෑ දක්ෂතාවයෙන් ලද ජයග්‍රහණයට ශක්තිමත් පැවැත්මක් හා දීර්ඝ ගමනාන්තයක් ඇත.

## කාර්‍ය මණ්ඩලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 27 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

| | තනතුරු නාමය | වැටුප් තලය | තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ ජෙනරාල් | HM 2-1 | 01 | 01 | - |
| 02. | අධ්‍යක්ෂ | HM 1-1 | 02 | - | 02 |
| 03. | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | MM 1-1 | 02 | - | 02 |
| 04. | ගණකාධිකාරි | MM 1-1 | 01 | - | 01 |
| 05. | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | MM 1-1 | 01 | 01 | - |
| 06. | පරිපාලන නිලධාරි | JM 1-1 | 01 | - | 01 |
| 07. | භාෂා පරිවර්තක | MA 5-2 | 01 | - | 01 |
| 08. | පර්යේෂණ නිලධාරි | AR 1 | 03 | - | 03 |
| 09. | තොරතුරු තාක්ෂණ නිලධාරි | JM 1-1 | 01 | - | 01 |
| 10. | සංවර්ධන නිලධාරි | MA 3 | 03 | 03 | - |
| 11. | කළමනාකාර සහයක | MA 1-1 | 04 | 04 | - |
| 12. | රියදුරු | PL 3 | 04 | 03 | 01 |
| 13. | කාර්යාල සහයක | PL 1 | 03 | 03 | - |
| එකතුව | | | 27 | 15 | 12 |

## සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ ( තොරතුරු තාක්ෂණ හා බලාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ
පර්යේෂණ නිළධාරී
පර්යේෂණ නිළධාරී (02)
පරිපාලන නිළධාරී
මාණ්ඩලික ලේකම්
තොරතුරු තාක්ෂණ නිළධාරී
සංවර්ධන නිළධාරී
භාෂා පරිවර්තක
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර (02)
සංවර්ධන නිළධාරී
සංවර්ධන නිළධාරී
රියදුරු(04)
කාර්යාල සහයක (03)

## අපගේ සේවාවන්

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සිය අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සිදු කරනු ලබයි.

1. ජාතික, අන්තර්ජාතික හා පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක පරීක්ෂණ සිදු කිරීම.

2. තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිත කර ඇති බවට සනාථ වූ ක්‍රීඩකයින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම.

3. තහනම් ද්‍රව්‍ය භාවිතය හා එහි අහිතු විපාක පිළිබඳ ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, පාසල් සිසුන් දෙමාපියන් හා අනෙකුත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් දැනුවත් කිරීම.

4. දිවයින පුරා දිස්ත්‍රික්ක මට්ටමෙන් UNESCO ආයතනයේ අරමුදල් සහිතව ක්‍රීඩාවේ දි භාවිත වන තහනම් ද්‍රව්‍ය හා ක්‍රම, එහි අහිතු විපාක හා තහනම් ද්‍රව්‍ය පරීක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.

5. ක්‍රීඩාවේ යෙදීමේ දි තහනම් ද්‍රව්‍ය භාවිතය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා පාසල් විෂය මාලාවට මෙම අංගය එක් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

## දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් රුපියල් මිලියන 1.5 ක මූල්‍යාධාරයක් ලබා දි දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීමට අනුග්‍රහය දක්වන ලදී. ඒ අනුව 2014 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් වනතෙක් පහත දිස්ත්‍රික්ක වල මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය.

| දිනය | දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2014.03.24 | පුත්තලම | 102 |
| 2014.03.12 | හම්බන්තොට | 75 |
| 2014.07.10 | වවුනියාව | 28 |
| 2014.07.10 | කිලිනොච්චි | 79 |
| 2014.07.10 | මුලතිව් | 30 |
| 2014.07.10 | මන්නාරම | 24 |
| 2014.07.10 | යාපනය | 84 |
| 2014.07.11 | ත්‍රිකුණාමලය | 70 |
| 2014.07.17 | ගාල්ල | 107 |
| 2014.09.12 | කෑගල්ල | 70 |
| 2014.09.16 | ගම්පහ | 93 |
| 2014.10.30 | නුවරඑළිය | 35 |
| 2014.11.10 | පොලොන්නරුව | 68 |
| 2014.11.10 | මාතර | 91 |
| 2014.11.11 | අනුරාධපුර | 106 |
| 2014.11.14 | බදුල්ල | 137 |
| 2014.03.13 | රත්නපුර | 76 |
| 2014.12.03 | මොණරාගල | 64 |
| | **එකතුව** | **1339** |



දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ




දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ



දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ

මෙම දැනුවත් කිරීම් පවත්වනු ලැබුවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, ක්‍රීඩා පරිපාලකයන්, ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ගේ දෙමාපියන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන පුද්ගලයන් සඳහා වේ. එහිදී පහත සඳහන් කරුණු අවධාරණය කරන ලදී.


- ලෝක මත්ද්‍රව්‍ය විරෝධතා වැඩසටහන පිළිබඳ මූලික අවබෝධය
- ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ගේ අයිතීන් හා වගකීම්
- තහනම් උත්තේජක භාවිතය වලක්වා ගැනීමේ චිකිත්සක ක්‍රමවේදය
- මත්ද්‍රව්‍ය පාලනය කිරීමේ ක්‍රියාවලිය
- අවශ්‍ය තොරතුරු ලබාගන්නා ක්‍රමවේදය
- ලෝක තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ඇතුලත් ලේඛණය
- උත්තේජක ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක


මීට අමතරව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.


ඔබේ ශක්තිය විශ්වාස කරන්න. එය උත්තේජකවලට භාරදී අතරමං නොවන්න.

| දිනය | සම්මන්ත්‍රණය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2014.01.10 | වයඹ විශ්ව විද්‍යාලයීය විද්‍යාර්ථීන් | 31 |
| 2014.03.05 | කඩු හරඹ ක්‍රීඩකයින් | 19 |
| 2014.03. | ක්‍රීඩා ශක්ති ක්‍රීඩකයින් | |
| 2014.03. | ශ්‍රී ලංකා රග්බි පාසල | |
| 2014.05.22 | ක්‍රීඩා සම්බාහන හා කායික ප්‍රතිකාර සහායකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලාව | 40 |
| 2014.06.10 | ජාතික කාන්තා ක්‍රිකට් කණ්ඩායම සහ සංවර්ධන බලකාය | 37 |
| 2014.06. | කායවර්ධන ක්‍රීඩකයින් | 12 |
| 2014.07.08 | පාපැදි ක්‍රීඩාවේ පුහුණුකරුවන් | 23 |
| 2014.09.18 | නාවික හමුදා මල්ලව පොර ක්‍රීඩකයින් | 15 |
| 2014.11.14 | උතුරු පළාත් ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා | 82 |
| 2014.11.20 | ඌව පළාත් ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා | 28 |
| 2014.11.25 | නැගෙනහිර පළාත් ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා | 80 |
| 2014.11.27 | මධ්‍යම පළාත් ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා | 33 |
| 2014.12.01 | උතුරු මැද පළාත් ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා | 54 |
| 2014.12.04 | දකුණු පළාත | 63 |
| 2014.12.08 | වයඹ පළාත | 36 |
| 2014.12.10 | සබරගමුව පළාත | 65 |
| 2014.12.18 | වයඹ ක්‍රීඩා නිලධාරීන් සඳහා | 43 |
| 2014.12.19 | ත්‍රිකුණාමලය | 35 |
| | **එකතුව** | **696** |

## අත් පත්‍රිකා







ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රයම ආවරණය වන ඉහත වැඩසටහන් සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන් තුළින් දැනුවත් කිරීමේ පත්‍රිකා ද මෙම වැඩසටහන්වලට සහභාගිවන්නන් අතර බෙදාදෙනු ලැබීය.

## තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීම-2014

| දිනය | ක්‍රීඩාව | පරීක්ෂණ ගණන | පරීක්ෂණ අවස්ථාව |
|---|---|---|---|
| 2014.01.03 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.01.04<br>2014.01.05 | රග්බි | 08 | තරගය තුළ දී |
| 2014.01.19 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.01.18 | මලල ක්‍රීඩා | 04 | තරගය තුළ දී |
| 2014.03.20 | බයිසිකල් ධාවන තරග | 06 | තරගය තුළ දී |
| 2014.04.04<br>2014.04.25 | බයිසිකල් ධාවන තරග | 03 | තරගය තුළ දී |
| 2014.04.27 | බර ඉසිලීම | 05 | තරගය තුළ දී |
| 2014.04.30 | බයිසිකල් ධාවන තරග | 12 | තරගය තුළ දී |
| 2014.05.09<br>2014.05.26 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.05.10<br>2014.05.29 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.05.13 | බොක්සිං | 10 | තරගය තුළ දී |
| 2014.05.17 | මලල ක්‍රීඩා | 04 | තරගය තුළ දී |
| 2014.05.19 | බර ඉසිලීම | 04 | තරගයෙන් පිටත දී |
| 2014.05.25 | මලල ක්‍රීඩා | 04 | තරගය තුළ දී |
| 2014.05.24 | බයිසිකල් ධාවන තරග | 04 | තරගය තුළ දී |
| 2014.05.29 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.06.07 | බැඩ්මින්ටන් | 04 | තරගය තුළ දී |
| 2014.06.13 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.06.14 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.06.14 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.06.22 | රග්බි | 04 | තරගය තුළ දී |
| 2014.06.23 | බර ඉසිලීම | 01 | තරගයෙන් පිටත දී |
| 2014.06.30 | ක්‍රිකට් | 09 | තරගය තුළ දී |
| 2014.07.02 | ක්‍රිකට් | 06 | තරගය තුළ දී |
| 2014.07 14 | බර ඉසිලීම | 01 | තරගයෙන් පිටත දී |
| 2014.07 03 | රග්බි | 09 | තරගයෙන් පිටත දී |
| 2014.07.07 | බොක්සිං | 05 | තරගයෙන් පිටත දී |
| 2014.07.07 | බර ඉසිලීම | 02 | තරගයෙන් පිටත දී |

12 වැනි පිටුවට.........

11 වැනි පිටුවෙන් ඉතිරි……

| දිනය | ක්‍රීඩාව | පරීක්ෂණ ගණන | පරීක්ෂණ අවස්ථාව |
|---|---|---|---|
| 2014.07.07 | පිහිනුම් | 01 | තරගයෙන් පිටත දී |
| 2014.07.09 | රග්බි | 01 | තරගයෙන් පිටත දී |
| 2014.07.08 | රග්බි | 03 | තරගයෙන් පිටත දී |
| 2014.07.08 | රග්බි | 16 | තරගයෙන් පිටත දී |
| 2014.08.12 | මලල ක්‍රීඩා | 02 | තරගය තුළ දි |
| 2014.08.13 | මලල ක්‍රීඩා | 03 | තරගය තුළ දි |
| 2014.08.14 | මලල ක්‍රීඩා | 01 | තරගය තුළ දි |
| 2014.09.17 | රග්බි | 01 | තරගයෙන් පිටත දී |
| 2014.09.18 | මල්ලවපොර | 07 | තරගයෙන් පිටත දී |
| 2014.09.10 | බර එසවීම | 01 | තරගයෙන් පිටත දී |
| 2014.09.10 | රුවල් ඔරු | 01 | තරගයෙන් පිටත දී |
| 2014.09.10 | මල්ලවපොර | 01 | තරගයෙන් පිටත දී |
| 2014.09.29 | කායවර්ධන | 03 | තරගය තුළ දි |
| 2014.10 03 | මලල ක්‍රීඩා | 03 | තරගය තුළ දි |
| 2014.10.14 | බර එසවීම | 03 | තරගය තුළ දි |
| 2014 11 10 | බොක්සිං | 01 | තරගයෙන් පිටත දී |
| 2014.10 26 | මලල ක්‍රීඩා | 07 | තරගය තුළ දි |
| 2014.09 25 | මලල ක්‍රීඩා | 01 | තරගයෙන් පිටත දී |
| 2014.10.26 | මලල ක්‍රීඩා | 01 | තරගය තුළ දි |
| 2014.11.29 | රග්බි | 04 | තරගය තුළ දි |
| 2014.12.05 | රග්බි | 03 | තරගය තුළ දි |
| 2014.12.05 | රග්බි | 01 | තරගය තුළ දි |
| 2014.12.13 | රග්බි | 01 | තරගය තුළ දි |
| 2014.12.14 | රග්බි | 01 | තරගය තුළ දි |
| 2014 07 23 | කායවර්ධන | 01 | තරගයෙන් පිටත දී |
| 2014 12 13 | රග්බි | 04 | තරගය තුළ දි |
| 2014 12 14 | රග්බි | 04 | තරගය තුළ දි |
| 2014 09 11 | වොලිබෝල් | 10 | තරගය තුළ දි |
| 2014 09 12 | වොලිබෝල් | 06 | තරගය තුළ දි |
| 2014 09 13 | වොලිබෝල් | 03 | තරගය තුළ දි |
| | **එකතුව** | 232 | |


## තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකල ආකාරය

| පරීක්ෂා කල අවස්ථාව | පරීක්ෂණ ගණන |
|---|---|
| තරගය තුල දී | 175 |
| තරගයෙන් පිටතදී | 57 |
| එකතුව | 232 |



## ක්‍රීඩා අනුව තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීම

| එකතුව | පරීක්ෂණ ගණන |
|---|---|
| බර ඉසිලීම | 17 |
| රුවල් ඔරු පැදීම | 01 |
| මල්ලවපොර | 08 |
| වොලිබෝල් | 19 |
| රග්බි | 92 |
| කාය වර්ධන | 04 |
| මලල ක්‍රීඩා | 30 |
| බැඩ්මින්ටන් | 04 |
| ක්‍රිකට් | 15 |
| බොක්සිං | 16 |
| පිහිනීම | 01 |
| පාපැදි තරග | 25 |
| **එකතුව** | **232** |




## තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා - 2014

| **ක්‍රීඩාව** | **ගණන** |
|---|---|
| රග්බි | 3 |
| කායවර්ධන | 1 |
| බර ඉසිලීම | 1 |
| **මුළු ගණන** | **5** |

2014 වර්ෂයට අදාල තහනම් ද්‍රව්‍ය හා ක්‍රම පිලිබඳ ලැයිස්තුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් තුනෙන්ම ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වේ. ඒ අනුව එම ලැයිස්තුව 2014.09.05 දින රජයේ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී.



## 2014 වර්ෂයේ සිදු කරන ලද බඳවා ගැනීම්

මෙම ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට කලමණාකරණ සහායක නිලධාරීන් 04 දෙනෙකු සහ කාර්යාල සහායකයින් 03 දෙනෙකු ඇතුලත් වේ. 2014.09.15 වන දින කලමණාකරණ සහායකයින් දෙදෙනෙකු සහ කාර්යාල සහායකයින් තිදෙනෙකු බඳවා ගන්නා ලදී.

එමෙන්ම, පහත සදහන් තනතුරු වලට අදාල “ඇබෑර්තු ඇත” දැන්වීම් 2014.09.28 දින සිළුමිණ, තිනකරන් සහ සන්ඩේ ඔබ්සවර් යන පුවත්පත්වල පල විය.

01. අධ්‍යක්ෂ (සැලසුම්)
02. සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂක
03. ගණකාධිකාරි
04. පරිපාලන නිලධාරි
05. පර්යේෂණ නිලධාරි
06. තොරතුරු තාක්ෂණ නිලධාරි.
07. සංවර්ධන නිලධාරි

2014.09.28 දින පළ වූ පුවත්පත් දැන්වීමට අනුව 2014.11.19 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා 2014.11.20 දින සංවර්ධන නිලධාරිණියන් තිදෙනෙකු බදවා ගන්නා ලදී.

මීට අමතරව 2014.11.17 දින කාර්යාල කාර්ය සහායක මහත්මයෙකුගේ ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ තනතුරට වෙනත් අයෙකු බඳවා ගැනීම ද සිදු කෙරිණි. එදිනම කළමනාකරණ සහායක තනතුරට ද දෙදෙනෙකු බදවා ගන්නා ලදී.



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය අලුතින් පිහිට වූ ආයතනයක් වන බැවින් හා උත්තේජක භාවිතය වැළැක්වීම සහ අහිතු විපාක පිළිබඳ පොදු මහජනතාව අතර අවබෝධයක් නොමැති බැවින්, එය වැඩි දියුණු කිරීම සදහා අවශ්‍ය කටයුතු සම්පාදනයට, වගකීමක් මෙම ආයතනය සතුව පවතී. ඒ වෙනුවෙන් අවශ්‍ය ප්‍රචාරණ කටයුතු ද මෙම වසර නිම වීමට ප්‍රථමයෙන් සිදු කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙය දීප ව්‍යාප්ත මට්ටමින් සියළු පාසල්, ක්‍රීඩාංගන ආදිය ආවරණය වන පරිදි සිදුකෙරෙනු ඇති අතර අප ආයතනයට වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ කටයුතු ද මේ වන විට අවසන් කර ඇත.



වෙබ් අඩවිය විවෘත කිරීම

ප්‍රචාරණ කටයුතුවල මුල් අදියර දෙසැම්බර් මස මැද භාගයේ දි ආරම්භ කෙරුණු අතර, වෙබ් අඩවිය එළි දැක්වීමේ කටයුත්ත ද 2014.12.24 වන දින ක්‍රීඩා අමාත්‍යාංශ ප්‍රධාන ශ්‍රවණාගාරයේ දි ගරු අමාත්‍ය මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් පැවැත්විණි. ඉන් අනතුරුව ආරම්භයේ සිට මුල් වසර තුළ දි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදුකරන ලද කර්තව්‍යයන් අලලා මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම ද සිදුකෙරිණි.

තහනම් උත්තේජක ලබා ගැනීමත් ලබා දීමත් ක්‍රීඩා දිවියේ සැබෑ වරදකි.

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන 2015 උත්තේජක ගැනීමට එරෙහි රීතින් මාලාව ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි අවශ්‍ය වෙනස්කම් සහිතව සකස් කර එම ආයතනයේ අනුමැතිය පිණිස යැවීම 2014 වසරේ අග භාගයේ දි සිදු කරන ලදි.

## 2015 තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව

එමෙන්ම, 2015 වර්ෂයට අයත් තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ද සිංහල හා දෙමළ මාධ්‍යන්ට පරිවර්තනය කර එය ත්‍රෛභාෂිකව රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා මේ වන විට අමාත්‍යංශයේ ලේකම්තුමා වෙත ලබා දී තිබේ. එම ලැයිස්තුව 2015 ජනවාරි පළමුවැනිදා සිට බල පැවැත්වේ.

2014.10.09 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගන්නා ලද 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේ දි උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ සාදන ලද නියෝග පිළිබඳ සභාව කල්තබන අවස්ථාවේ 2014.10.23 දින ප.ව. 6.30 සිට ප.ව. 8.30 දක්වා පැවැත්වුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු හා නිලධාරීනියන් දෙදෙනෙකු අප ආයතනය නියෝජනය කරමින් සහභාගි විය. එහි දි තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව සම්බන්ධ නියෝග ඇතුළත් අංක 1878/44 හා 2014.09.05 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය එදින විවාදයට බඳුන් විය. එහි දි අප ආයතනය විසින් සිදු කරනු ලබන මෙහෙවර ගරු අමාත්‍යතුමාගේ පැසසුමට ද ලක් විය.

ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැඩසටහනේ දි ප්‍රතිපත්ති අංක 25 ඉදිරි වසර පහ තුළ තහනම් කරන ලද ඖෂධ හා උත්තේජක භාවිතාව තහනම් කිරීම යටතේ වැඩපිළිවෙලක් සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සම්ප්‍රදානය ලබා දුන්නේය.

2014.11.25 දින ක්‍රීඩා අමාත්‍යංශයේ පැවති මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේ දි ගරු අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාවක් අනුව පැරණි ක්‍රීඩා සංවර්ධන ගොඩනැගිල්ලේ දැනට ක්‍රීඩා සංගම්වලට ලබා දි ඇති පරිශ්‍රයෙන් එක් තට්ටුවක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්ථාපනය කිරීම පිණිස ලබා දීමට තීරණය විය. එහි ඇතැම් අළුත්වැඩියා කටයුතු සිදු කළයුතු බැවින් ඒ සඳහා අවශ්‍ය මූලික පියවරයන් ගැනීම ද 2014 වර්ෂය අග භාගයේ දි සිදු විය. ඒ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ සහාය ඇතිව ඒ සඳහා යන වියදම ඇස්තමේන්තුගත කෙරිණි.



## වෙනත් විශේෂ අවස්ථා

### විදේශීය

- 2014.03.24 දින සිට 2014.03.26 දින දක්වා ස්විට්සර්ලන්තයේ පැවති 2014 INADO වැඩමුළුව හා INADO හි වාර්ෂික මහ සභා රැස්වීමට ශ්‍රී ලංකාවේ නියෝජිතයින් දෙදෙනෙකු සහභාගි වූහ. මෙහි දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය INADO සාමාජිකත්වය ලබා ගැනීම ද සිදුවිය.

- ස්විට්සර්ලන්තයේ පැවැත් වූ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ (World Anti-Doping Agency) තහනම් උත්තේජක සම්මන්ත්‍රණයට ද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නියෝජිතයන් දෙදෙනෙකු සහභාගි වූහ.

- මාල දිවයිනේ, මාලේ නුවර 2014.04.28 දින සිට 2014.05.01 දින දක්වා පැවති දකුණු ආසියානු කලාපීය උත්තේජක මර්දන සමුළුවට, මණ්ඩල රැස්වීමට හා ප්‍රතිඵල කලමනාකරණය පිළිබඳ පුහුණුවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නියෝජිතයන් දෙදෙනෙකු සහභාගි වූහ.

- ක්‍රීඩාවේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි වීම යන මැයෙන් කොරියාවේ ජේජු දූපතේ පැවති ආසියා/ඕෂනියා කලාපීය අන්තර්-රාජ්‍ය අමාත්‍ය රැස්වීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සභාපතිතුමා සහභාගි විය.

- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යාපන හා පරීක්ෂණ අංශයේ අධ්‍යක්ෂකතුමිය ජපානයේ ටෝකියෝ නුවර පැවති International Acadamy of Sports Science And Technology ආයතනය හා අනුබද්ධව Tsukuba International Academy for Sports Science ආයතනය විසින් සංවිධානය කළ රටවල් 21 ක 37 දෙනෙකු පමණ සහභාගි වූ සති 02 ක පුහුණු වැඩසටහනකට 2014.09.27 වැනි දින සිට 2014.10.13 වැනි දින දක්වා සහභාගි විය.

- 2014.10.22 දින සිට 2014.10.26 දින දක්වා ප්‍රංශයේ පැරිස් නුවර පැවති WADA TUE Symposium 2014 සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි විය.

## 2015 වර්ෂයට අදාළ ඉලක්ක සහ අරමුණු

- ඉදිරි වර්ෂයේදි මෙම ආයතනයේ මූලික අවධානය දේශිය වෛද්‍ය ක්‍රමයේ භාවිතා වන ඖෂධවල අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකි ද යන්න සොයා බැලීම සඳහා පර්යේෂණවල නියැලීම වෙනුවෙන් ද යොමු කිරීමට බලාපොරොත්තු වේ.

- එමෙන්ම 2015 වර්ෂයේ දි උත්තේජක ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ කටයුතු තවදුරටත් පුළුල් කිරීමටත්, පර්යේෂණ අංශය පිළිබඳව වැඩිදුර අවධානය යොමු කිරීමටත්, උත්තේජක ද්‍රව්‍ය ලබාගත් බවට සනාථ වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිබඳ විනය පරීක්ෂණ තවදුරටත් කාර්යක්ෂමව සිදු කිරීමටත් අරමුණු කෙරේ.

- ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති නිසා සියළු පහසුකම් වලින් සහ උත්තේජක පරීක්ෂණයන්ට අවශ්‍ය සියළු නව උපාංග වලින් සමන්විත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ද බලාපොරොත්තු වේ.

- උත්තේජක පරීක්ෂණ සිදු කිරීමේ දි අවශ්‍ය කාර්ය මණ්ඩලය වන උත්තේජක පරීක්ෂණ පාලක නිලධාරීන් (Doping Control Officers) සහ ක්‍රීඩකයාගේ පරීක්ෂණ අවස්ථාවේ භාරකරුවන් (Chaperone) ජාත්‍යන්තර ක්‍රමවේදයන්ට හා ප්‍රමිතීන්ට අනුව පුහුණු කිරීම ද මේ වර්ෂයේ අරමුණු අතර වේ.

# මූල්‍ය වාර්තාව 2014
# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

| අං. | විස්තරය | වෙන් කල මුදල (රු. මිලියන ) | වියදම් කළ මුදල (රු. මිලියන ) | ප්‍රතිශත අගය % |
|---|---|---|---|---|
| **01** | **ප්‍රාග්ධන වියදම්** | | | |
| 01.01 | ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම් | 1.00 | 0.76 | 76% |
| 01.02 | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම් | 2.30 | 1.79 | 78% |
| 01.03 | ගොඩනැගිලි | 1.70 | 0.04 | 02% |
| | ***උප එකතුව*** | ***5.00*** | ***2.59*** | ***52%*** |
| **02** | **පුනරාවර්තන වියදම්** | | | |
| 02.01 | වැටුප් හා වේතන | 3.70 | 1.88 | 51% |
| 02.02 | ගමන් වියදම් | 2.70 | 2.64 | 98% |
| 02.03 | සැපයුම් | 2.65 | 1.90 | 72% |
| 02.04 | නඩත්තු වියදම් | 1.50 | 0.00 | - |
| 02.05 | සේවා | 9.45 | 8.30 | 88% |
| | ***උප එකතුව*** | ***20.00*** | ***14.72*** | ***74%*** |
| | **මුළු එකතුව** | **25.00** | **17.31** | **69%** |